**බිබිල ප්‍රාදේශීය සභාව - 2023**

---------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බිබිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුල වැඩ අවසන් කරන ලද රු. 34,824,386 ක් වූ කර්මාන්ත 02 ක වටිනාකම රු. 19,052,937 ක් ලෙස රු. 15,771,449 ක් අඩුවෙන් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණු අතර රු. 3,923,564 ක් වූ කර්මාන්ත 03 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ලෙස රු. 110,394 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සකස් කරන විට ආරම්භක ශේෂ නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු. 1,299,828 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ ලද රු. 127,829 ක සෘජු ප්‍රේෂණ සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා නොගෙන සමුච්චිත අරමුදල හර කර තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 44,962,842 ක කර්මාන්ත ණය හිමි ශේෂයෙන් රු. 37,761,419 ක් හඳුනා ගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සකස් කරන විට කර්මාන්ත ණයහිමි ශේෂය නිවැරදි කරන බව. | ණයහිමි පැවැත්ම තහවුරු කර ගැනීමකින් තොරව ගෙවිය යුතු ණය ශේෂ කපා හැරීම් සිදු නොකල යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | සභාව සතු සියලුම ආදායම් හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| එකතු වටිනාකම රු. 683,450,303 ක් වූ වත්කම් විෂයයන් 05 ක් සහ වගකීම් විෂයයකට අදාලව හිමිකම් ඔප්පු, වෘත්තීය තක්සේරු වාර්තා, යාවත්කාලීන කරන ලද කර්මාන්ත ණයහිමි, ණයගැති ලේඛන, උපලේඛන සහ හිඟ හිටි වෙනත් ආදායම් ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | අදාල ලේඛන යාවත්කාලීන කරන ලෙසට විෂයභාර නිලධාරීන් දැනුවත් කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) 19 (XII) වගන්තිය | ❖ කඩ කාමර 04 ක් 2015 වර්ෂයේ සිට 2030 වර්ෂය දක්වා වසර 15 ක කාලයක් සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව බදු දී තිබුණි. | ඉදිරියේදී වසර 03 ක කාලයක් සඳහා බදුකරුවන් සමඟ ගිවිසුම්ගතවීමට කටයුතු කරන බව. | දීර්ඝකාලීනව බදුදීමට අදාලව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ii) 24(1) (අ) වගන්තිය | මාර්ග ඉන්වෙන්ට්‍රියේ ඇතුළත් මාර්ග 481 න් මාර්ග 454 ක් ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. | GPS තාක්ෂණය මගින් මාර්ග පිළිබඳ සමීක්ෂණයක් සිදු කරමින් පවතින බව හා සමීක්ෂණයෙන් අනතුරුව මාර්ග සියල්ල ගැසට් කරන බව. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනකර ගැසට් පත්‍රයේ පලකළ යුතුය. |
| (iii) 154(1) වගන්තිය | ප්‍රාදේශීය සභා සීමාව තුල ඉඩම් විකිණීමේදී විකුණුම් මුදලින් සියයට එකක ප්‍රමාණයක් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වුවත් විකුණන ලද ඉඩම් කට්ටි 147 කට අදාල සියයට එකක මුදල සභාව විසින් අයකරගෙන නොතිබුණි. | එකවර බදු මුදල් ගෙවීමක් නොකරන අතර ඉඩම් කට්ටි අලෙවි වන ආකාරය අනුව බදු මුදල් ගෙවනු ලබන බව. | ප්‍රාදේශීය සභා පනත අනුව අදාල බදු මුදල් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි 571 | වසර 02 ක ඉක්ම වූ රු. 943,538 ක තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | තැන්පත් කරුවන් ලිඛිතව දැනුවත් කර ඇති අතර ඉදිරිපත් නොවන තැන්පත් කරුවන්ගේ ශේෂ ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ)1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 83(1) | 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 378 ක් අතුරින් සැලසුම් 258 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභාවේ එක් කාර්මික නිලධාරියෙකු පමණක් රාජකාරි ඉටුකරන බැවින් ඔහුට පැවරී ඇති අනෙකුත් රාජකාරි සමඟ මෙම කටයුතු සිදු කිරීම අපහසුවී ඇති බව හා ඉදිරියෙදී මෙම කටයුතු විධිමත් කිරීමට කටයුතු කරන බව. | සභාව විසින් බලප්‍රදේශයේ සිදුකරන ඉදිකිරීම් නියාමනය කළ යුතුය. |
| (ඈ) 2017 මාර්තු 16 දිනැති අංක 2010/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 01 සහ 02 වගන්තිය | සභාව විසින් 2021 හා 2022 වර්ෂවල ඉදිකරන ලද නල ළිං 18 සඳහා අදාල වන ව්‍යාපෘති වාර්තා ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණයට ඉදිරිපත් කර නොතිබුණු අතර එම ඉදිකිරීම් සිදු කිරීමට පෙර ජල සම්පත් මණ්ඩලයේ ලිඛිත අවසරයද ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාල කටයුතු කිරීමේදී ජල සම්පත් මණ්ඩලයේ නිර්දේශ හා නියමයන් යටතේ ඉටුකරන ලෙසට අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව. | ගැසට් පත්‍රයේ සඳහන් පරිදි කටයුතු කළ යුතුය. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,091,889 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 18,142,593 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තු ගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| (i) | වරිපනම් හා බදු | 14,007,866 | 10,916,460 | 7,759,257 | 3,157,203 | 12,785,798 | 9,668,114 | 2,441,188 | 7,226,926 |
| (ii) | කුලී | 24,900,320 | 22,922,350 | 21,768,427 | 1,153,923 | 24,130,946 | 23,375,625 | 16,898,884 | 6,476,740 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,793,300 | 1,589,875 | 1,589,875 | - | 2,040,400 | 1,737,350 | 1,457,900 | 279,450 |
| (iv) | වෙනත් ආදායම් | 11,696,500 | 17,153,538 | 6,827,752 | 10,325,786 | 3,392,500 | 25,434,313 | 13,563,160 | 11,871,153 |
| | එකතුව | 54,397,986 | 52,582,223 | 37,945,311 | 14,636,912 | 42,349,644 | 60,215,402 | 34,361,132 | 25,854,269 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු**<br>(අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 3,188,748 ක් වූ වරිපනම් බදු ආදායමෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. 1,664,969 ක් හෙවත් සියයට 52 ක ප්‍රමාණයක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | බිල්කළ ආදායම රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 6,027,300 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් රු. 4,713,880 ක් හෙවත් සියයට 78 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ වරිපනම් කඩිනමින් අයකල යුතුය. |
| (ඇ) දේපළ 14 ක් බදුදීම වෙනුවෙන් 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා රු. 4,164,795 ක බදු ආදායමක් අයකරගෙන නොතිබුණි. | 2007 හා 2019 වර්ෂවල හිඟ අයකරගැනිමට නඩු පවරා ඇති බව හා කොවිඩ් හේතුවෙන් බදු සහන සැලසීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට ලිපි යොමු කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකල යුතුය. |
| **<u>කුලී</u>** | | |
| කඩ කාමර 138 කින් 2016 වර්ෂයේ සිට අයවිය යුතු පවතින කඩ කාමර කුලී රු. 1,210,767 ක කඩ කාමර කුලී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | රු.1,117,267 ක් කොවිඩ් වසංගත තත්ත්වය මත අයකර ගැනීමට නොහැකිවීම හේතුවෙන් කපාහැරීම සඳහා ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතියට යවා ඇති අතර ඉතිරි හිඟ කුලී අයකර ගැනීමට අදාලව නඩු පවරා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකල යුතුය. |
| **<u>වෙනත් ආදායම්</u>** | | |
| (අ) ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයන් 499 දෙනෙකුගෙන් 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අයවිය යුතු රු. 1,554,849 ක හිඟ ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ ජල ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ගාස්තු කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) බලප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබුණු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 11 කින් 2020 වරෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු රු. 191,250 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. | හිඟ අයකරගැනීමට ආදායම් පරීක්ෂක නිලධාරි දැනුවත් කර ඇති අතර අදාල වෙළඳ ආයතන ලිඛිතව දැනුවත් කර ඇති බව. | අදාල කාලවලදීම ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 71,898 ක් සහ මුද්දර ගාස්තු රු. 12,001,830 ක් ගෙන්වාගෙන නොතිබුණි. | මෙම ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකල යුතුය. |

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>පනතින් පවරා ඇති කාර්යයන් ඉටුකිරීම</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | අකළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව විසින් 2021 හා 2022 වර්ෂවල ඉදිකරන ලද නල ළිං 18 ක ජලය පානය සඳහා සුදුසු ද යන්න පිළිබඳව ජල සාම්පල් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ජල සාම්පල් පරික්ෂාවක් කරන ලෙස විෂය භාර නිලධාරීන් දැනුවත් කල බව. | පානීය ජලය පිළිබඳ තත්ත්ව පරීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ආ) නායකඳුර ජල පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය රු. 35,380,858 ක පිරිවැයක් දරා 2017 වැඩ අවසන් කර තිබුණු අතර, 2018 ජුනි මාසයෙන් පසු ජලය පිරිපහදු කිරීමකින් තොරව පාරිභෝගිකයින් වෙත ලබාදීම සිදු කරන බව නිරීක්ෂණය විය. එසේම නායකඳුර සහ රතු පස්කැටිය ජල ව්‍යාපෘතිවල ජල සාම්පල් පරීක්ෂා කිරීමකින් තොරව ජනතාව සඳහා ජලය බෙදාහැර තිබුණි. | ඉදිරි මාස කිහිපය ඇතුලත ජල පිරිපහදුව සිදුකර පිරිසිදු ජලය ලබා දීමට කටයුතු කරන බව. | පානීය ජලය පිළිබඳ තත්ත්ව පරීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ඇ) 2023 වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ආයතන සම්බන්ධ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සමස්ථ සමීක්ෂණයක් සිදු නොකල අතර සිදුකල සමීක්ෂණයෙන් අලුතින් බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත 12 ක් හඳුනාගෙන ඇති බව. | බල ප්‍රදේශයේ කර්මාන්ත නියාමනය කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) පාරිසරික ආරක්ෂණ බලපත්‍රවල වලංගු කාලය ඉකුත් වී තිබුණු බලපත්‍ර 09 ක් අලුත් කිරීමට සහ සමාලෝචිත වර්ෂයට අදාලව හඳුනා ගන්නා ලද කර්මාන්ත 12 ක් සඳහා බලපත්‍ර ලබාදීමට කටයුතු නොකිරීම හේතුවෙන් රු. 84,000 ක ආදායමක් සභා ඇමුදලට අහිමි වී තිබුණි. | 2024 වර්ෂයේදි පරිසර බලපත්‍රය ලබා දීමට කටයුතු කිරීමට ආදායම් පරීක්ෂක නිලධාරි දැනුවත් කර ඇති බව. | බල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන කර්මාන්ත නියාමනය කල යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මොනරාගල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් එවන ලද මුද්දර ගාස්තු උපලේඛනය අනුව 2022 නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා ලැබිය යුතු රු. 3,176,600 ක මුදලින් රු. 2,146,222 ක් ලැබී තිබුණු අතර ඉතිරි මුදල් අයකර ගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි. | ලැබිය යුතු රු.1,030,378ක මුදල සම්බන්ධයෙන් විමසීම් කර එම මුදල ලබා ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) 2022 වර්ෂයේ සිදුකළ භාණ්ඩ සමීක්ෂණයෙන් ප්‍රාදේශීය සභාවට අයත් කුළු ගෙඩි, පයිප්ප, උදළු, මුල්ලු ඇතුළු වර්ග 11 කට අයත් භාණ්ඩ 14 ක් නොමැති බවට හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මේ සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් හඳුනාගෙන ඔවුන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම භාණ්ඩ වලින් කොටසක් සොරුන් විසින් රැගෙන ගොස් ඇති අතර සෙසු භාණ්ඩ සඳහා වගකිවයුතු පාර්ශවයන්ගෙන් අදාල වටිනාකම් අයකර ගන්නා ලෙස විෂය නිලධාරී දැනුවත් කර ඇති බව. | අලාභය වගකිවයුතු පාර්ශවයන් වෙතින් අයකර ගත යුතුය. |
| (ඇ) පුරප්පාඩුවක් නොමැතිව තිබියදී අනුමැතියකින් තොරව විශ්‍රාමික කාර්මික නිලධාරියෙකු සේවයේ යොදවාගෙන සමාලෝචිත වර්ෂයේ ජනවාරි, පෙබරවාරි මාස දෙක සඳහා රු. 89,600 ක දීමනා ගෙවා තිබුණි. | මෙම දීමනාව නැවත ගෙවන ලෙස අදාල නිලධාරියා ලිඛිතව දැනුවත් කර ඇති අතර පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ලිපියක් යවා ඇති බව. | දීමනා ගෙවීම විධිමත් අනුමැතියක් යටතේ සිදුකල යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ------------------------------------ | ---------------- |
| ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 84 කට අදාල බදු ගිවිසුම්වල ගිවිසුම අවසන් වන කාලය දක්වා නොතිබුණු අතර ඉන් කඩ කාමර 23 ක් බදු දී වසර 20 ක කාලයක් ඉක්මවා තිබුණි. | පැරණි ගිවිසුම්වලද බදු කාල සීමාව ඇතුලත් කර නොමැති බැවින් නව බදු ගිවිසුම් වල ද බදු කාල සීමාව ඇතුලත් කිරීමට බදුකරුවන් එකඟ නොවීම හේතුවෙන් කාලය සඳහන් කර ගිවිසුම් ගත වීමට නොහැකි වී ඇති බව. | බදු ගිවිසුම් විධිමත්ව පවත්වා ගෙන යා යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ----------------------------------- | ---------------- |
| (අ) සභාව විසින් 2021 සහ 2022 වර්ෂවලදී ඉදිකර තිබුණු නල ළිං 04 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | නල ළිං ඉදිකිරිම සඳහා ඉල්ලුම් කල පුද්ගලයන් ගෙන්වා අදාල නල ළිං ප්‍රයෝජනයට ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇති බව. | පොදු අරමුදල් යොදවා සිදු කරන ව්‍යාපෘති පිලිබඳව පසු විපරම් කටයුතු සිදු කල යුතුය. |
| (ආ) ප්‍රාදේශීය සභාව සතු ජල බවුසරය 2020 අගෝස්තු මාසයේ සිට ද, අත් ට්‍රැක්ටර් ට්‍රේලරය 2008 වර්ෂයේ සිට ද භාවිතයෙන් ඉවත්කර තිබුණි. | මෙම වාහන කඩිනමින් අලුත්වැඩියා කර ආදායම් උත්පාදනය සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව. | වාහනවල කළ යුතු අලුත්වැඩියාවන් අදාල කාලයන් තුලදී සිදු කල යුතුය. |
| (ඇ) භාවිතා කරනු ලබන වාහන 03 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | මෙම වාහනවල නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | සභාව සතු වාහනවල නිත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු පරිගණක යන්ත්‍රයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් සකස් කරන විට ආරම්භක ශේෂ නිවැරදි කරන බව. | සභාවට ලැබෙන සියලුම වත්කම්වල පිරිවැය හඳුනාගෙන ගිණුම්ගතකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) ප්‍රාදේශීය සභාවට අයත් උඩු බුබුල විවේකාගාර ගොඩනැගිල්ල සහ සුසාන භූමි 46 ක වටිනාකම තක්සේරු කොට ගිණුම්ගතකර නොතිබුණි. | මෙම වත්කම්වල වටිනාකම තක්සේරු කිරීමෙන් පසු ගිණුම්ගත කරන බව. | සභාව සතු සියලුම වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ----------------------------------- | ---------------- |
| 2021 වර්ෂයේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රු. 1,445,400 ක වියදමකින් නල ළිං 06 ක් ඉදිකර තිබුණු අතර 2022 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරිමකින් තොරව නල ළිං 18 ක් ඉදිකිරීම සඳහා මිල ගණන් කැඳවා තිබුණි. | නල ළිං ඉදිකිරිමේදි ජලය ලැබෙන තෙක්ම කැනීම සිදුවන බැවින් ළිද කැනිමට පෙර ඇස්තමේන්තු සකස් කිරිම අපහසු බව. | ඉදිකිරිම සිදු කිරිමට පෙර අදාල මාර්ගෝපදේශයන් අනුව කටයුතු කල යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------------- | --------------- |
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 07 ක සේවකයින් 13 දෙනෙකුගේ ඌනතාවයක් සහ සේවකයින් 10 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු හා අතිරික්ත සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැනුවත් කර ඇති බව. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණකර ගත යුතු අතර අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරවාගත යුතුය. |
| (ආ) 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා සේවකයින් 03 කුට ලබා දුන් සේවක ණය රු. 201,543 ක් 2024 පෙබරවාරි වන විටත් අයකරගෙන නොතිබුණි. | තවදුරටත් හිඟව පවතින හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගන්නා බව. | සේවක ණය ශේෂ කඩිනමින් අයකරගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 08 ක සියයට 02 සිට සියයට 58දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 1 සිට සියයට 412 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිසි පරිදි අයවැය සකස් කිරීමට පියවර ගන්නා බව. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කළ යුතු අතර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව විසින් ගලි සේවාව මගින් ඉවත් කරනු ලබන මළ අපද්‍රව්‍ය පුවක් පැලය කසල අංගනය පිහිටි භූමියේ විවෘත කාණුවකට බැහැර කරන බවත් එම භූමියට මායිම්ව පිහිටි කුඩා දොල පාරට එකතු වී මාදුරු ඔයට එකතු වන බව නිරීක්ෂණය විය. | මල අපද්‍රව්‍ය බැහැර කිරිමේ පද්ධතියක් සකස් කර ගැනීමට අදාල ව්‍යාපෘති වාර්තාව පලාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කල බව. | මල අපද්‍රව්‍ය බැහැර කිරිම විධිමත්ව සිදු කල යුතුය. |
| (ආ) සභාව විසින් ගලි බැහැර කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණු අතර මළ අපද්‍රව්‍ය විධිමත් පරිදි බැහැර කිරීමේ ක්‍රම වේදයක් ද සභාව සතුව නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට ඉදිරියේදි කටයුතු කරන බව. | විධිමත්ව මල අපද්‍රව්‍ය බැහැර කල යුතු අතර අදාල පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතුය. |